**ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජූනි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 07/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව පරිහරණය කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කර ගත යුතු වුවත් රාජ්‍ය ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2019 ජනවාරි 22 දින දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ අංක KF 9142 දරන වාහනයේ අයිතිය නිරවුල් කර වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | 1.6.1 |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රාජ්‍ය ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2019 ජනවාරි මාසයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ වාහනයේ අයිතිය නිරවුල් කරගෙන තිබුණු නමුත් එහි වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදි නිවැරදි කරනු ලබන බව දන්වා තිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 වර්ෂයට අදාළව 2024 වර්ෂයේ ගෙවීම් කරන ලද වැය විෂයයන් හතරකට අදාළ එකතුව රු.1,322,716 ක් වූ වියදම් මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් යටතේ පෙන්නුම් කර නොතිබුණු අතර CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද සමුච්චිත බැදීම් හා බැරකම් වාර්තාව, හිස් වාර්තාවක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලට අමුණා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් තැබූ ආකාරයටම 2023 වර්ෂයේදී ද ගිණුම් තබන ලද බව දන්වා තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වේ. |

## 2.2 ප්‍රධාන ගණකාධිකාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.3 නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.4, 4.5, 4.6 සහ 6.3 උපවගන්ති | 266,762 | සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් වසරක කාලයක සිට අය විය යුතුව පවතින රු.220,300ක ආපදා ණය ශේෂය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් වසර 29 කට අධික කාලයක සිට අය විය යුතුව පවතින රු.46,462 ක ණය ශේෂ අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සේවයෙන් විශ්‍රාම ලැබූ නිලධාරියෙකුගෙන් අය විය යුතු ආපදා ණය ශේෂය වූ රු.220,300ක් වාරික වශයෙන් ගෙවීමට එකග වී ඇති බවත් රු.46,462 ක ණය ශේෂය කපා හැරීමට ඉල්ලීම් කර ඇති බවත් දන්වා තිබුණි | හිඟහිටි ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය - | දෙපාර්තමේන්තුවට අයත් වාහන සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර වාහන සම්බන්ධ 2023 වර්ෂයේ මාසික ප්‍රවාහන සේවා සටහන්, ඉදිරිපත් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | නව කාර්යාලයට පැමිණීමේ කටයුතු නිසා සිදු කළ නොහැකි වූ බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 04 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අදාල අනුමැතීන් ලබාගෙන පිටපත් යොමු කර නොතිබුණි. | 2025 සිට ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අදාළ කාලසීමාවන් තුල පිළියෙල කර අනුමැතිය ලබා ගත යුතු වේ. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම, භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌනතා හා වෙනත් නිර්දේශ නියමිත කාලය තුළ සිදු කර තිබීම, සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම, වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කිරීම, වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරීක්ෂා කිරීම, නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර විගණනයට ඉදිරිපත් කිරීම සහ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාලය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කිරීම යනාදී ඉටුකළ යුතු කරුණු ඉටුකර නොතිබුණු නමුත් ඒවා නිසි ලෙස ඉටුකර ඇති බවට සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර තිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | සත්‍ය තොරතුරු කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2002** වර්ෂයේදී මිලදී ගෙන තිබූ ත්‍රීරෝද රථයක් **2015** වර්ෂයේ සිට භාවිතයට නොගෙන ගාල් කර තිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | අදාළ තීරණ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු නිලධාරින් විසින් ඇප තැබීමට කටයුතු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරින් වන අධ්‍යක්ෂ, ගණකාධිකාරි, රියදුරු ඇතුළු නිලධාරින්ගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබීම්වලට අදාල අයදුම් පත් භාණ්ඩාගාරය වෙත 2023 නොවැම්බර් මස යවා ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල නිලධාරීන්ගෙන් ඇප අය කර ගත යුතු වේ. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 20කට අධික කාලයක් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිතා කර තිබුණු නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානය සහ කුරුකුලම් ආනපන්දි උපකාර්යාලය පිහිටා ඇති ගොඩනැඟිලි සහ ඊට අදාළ භූමිය යාපනය මහ නගර සභාවෙන් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණි. | අදාළ භූමිය යාපනය මහ නගර සභාවෙන් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට නඩුවක් පවරා ඇති බව දන්වා තිබුණි. | අදාළ පවරා ගැනීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතු වේ. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් කෝවිල් සඳහා මූල්‍යාධාර ලබා දීමට අදාළව කෝවිල් තෝරා ගැනීම, ලබාදෙන ආධාර මුදල් ප්‍රමාණය හා ප්‍රමුඛතාව යනාදී කරුණු ඇතුළත් කර අනුමත කර ගනු ලැබූ නිර්ණායක සහ ක්‍රමවේදයක් නොතිබුණු බැවින් සත්‍ය වශයෙන්ම ආධාර අවශ්‍ය වන කෝවිල් හඳුනාගෙන ඒවාට මූල්‍යාධාර ලබා දී ඇති බව නිරීක්ෂණය නොවිය. | ආධාර අවශ්‍ය වන කෝවිල් හඳුනාගෙන ඒවාට මූල්‍යාධාර ලබා දී ඇති බව දන්වා තිබුණි. | මූල්‍යාධාර ලබා දීමේදී සත්‍ය වශයෙන්ම ආධාර අවශ්‍ය වන කෝවිල් හඳුනාගෙන ඒවාට ප්‍රමුඛතාවය ලබා දිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 (2023) වර්ෂය සඳහා වූ ජාතික නිර්මාණ තරඟාවලියේ දහම් පාසැල් මට්ටම, ප්‍රාදේශීය මට්ටම දිස්ත්‍රික්ක මට්ටම සහ ජාතික මට්ටමට අදාළ තරඟ රු. **4,310,630** ක වියදමකින් **2023** ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ පවත්වා, ප්‍රතිඵල නිකුත් කර තිබුණ ද, ඊට අදාළ සහතික සහ ත්‍යාග ප්‍රදානයන් මෙම වාර්තාවේ දිනය වන විටත් සිදු කර නොතිබුණි. | සහතික සහ ත්‍යාග ප්‍රදානයන් 2024 අගෝස්තු මස පවත්වනු ලබන බව දන්වා තිබුණි. | තරඟාවලියට අදාළ සහතික සහ ත්‍යාග ප්‍රදානයන් කඩිනමින් සිදු කළ යුතු වේ. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව දන්වා තිබුණි. | ජාතික විගණන පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2001 අගෝස්තු 22 දිනැති 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05ක් එකම සේවා ස්ථානයෙහි සේවා කර ඇති සෑම නිලධාරියකුටම වෙනත් සේවා ස්ථානයක සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ක සිට වර්ෂ 35ක් දක්වා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් 117 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වී දිගු කාරලයක සිට ආයතනයේ සිටින නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කල යුතුය. |